*සැ. යු.*– 2007.04.20 දින පළවූ අංක 1494 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,495 - 2007 අප්‍රේල් 27 වැනි සිකුරාදා - 2007.04.27**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... | — |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 412 |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... | 413 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... | — |
| ආණ්ඩුවේ නිවේදන ... .. | 413 |
| මිළ පාලන දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් .. ... | — |
| ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන .. ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා .. ... | — |
| විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් .. ... | 414 |
| නැවියන්ට දැන්වීම් .. ... | — |
| සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් .. ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පලකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැලසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2007 අංක 158

## ජාතික ශිෂ්‍යභට බලකාය

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*(අ) 2002 සැප්තැම්බර් මස 01 වැනි දින සිට ලුතිනන් කර්නල් වශයෙන්*

මේජර් (තාවකාලික ලුතිනන් කර්නල්) කේඑස් පෙරේරා

*(ආ) 2003 අප්‍රේල් මස 29 වැනි දින සිට ලුතිනන් කර්නල් වශයෙන්*

මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) එස්එම්සීඑස් සිරිවර්ධන
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) වයිඒඑස්කේ ජයසිංහ
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) එස්ඩබ්යූ සඳරුවන්
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) කේපීපී චන්ද්‍රලතා (ගැ)
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) එම්ආර්ඩබ්එම්බීඒපීකේ මිල්ලවාන
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) එච්එම්පී සොයිසා
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) එස්එන්ඩබ්එස් බණ්ඩාර
මේජර් ( තාවකාලික ලුතිනන් කර්නල්) ඩබ්ඒඑස් අබේරත්න

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගොඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ දී ය.

04 - 435

---

2007 අංක 159

## ජාතික ශිෂ්‍යභට බලකාය

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල උසස් කිරීම්

2006 සැප්තැම්බර් මස 30 වැනි දින සිට තාවකාලික කපිතන් වශයෙන්

ලුතිනන් ටීඑම්ජේ ඒකනායක
ලුතිනන් ජේඑන්පීආර් රත්නප්‍රිය
ලුතිනන් ආර්එම්ඩබ්ලිව් අනුර බණ්ඩාර
ලුතිනන් ඩබ්ලිව්ඒආර් පෙරේරා
ලුතිනන් ටීජී සෝමරත්න
ලුතිනන් ඩීඑස්ටී වික්‍රමසිංහ
ලුතිනන් එම්ජී මාරසිංහ
ලුතිනන් ජීජී රොහාන් කුමාර
ලුතිනන් සීඑච්එම්ආර් චන්ද්‍රසේකර
ලුතිනන් එච්පීඩීඑන් ජයරත්න

2006 ඔක්තෝබර් මස 15 වැනි දින තාවකාලික කපිතන් වශයෙන්

ලුතිනන් එච්ඩබ්ලිව් සුමිත් කුමාර
ලුතිනන් එන්ඩී ගුණසේකර
ලුතිනන් එම්ටීයූ බලසේකර
ලුතිනන් කේඒඩබ්ලිව්එස් කොඩිතුවක්කු
ලුතිනන් කේජීඑම්පී වීරසේකර

2006 නොවැම්බර් මස 01 වැනි දින සිට තාවකාලික කපිතන් වශයෙන්

ලුතිනන් එම්එම්ජේකේපී පෙරේරා
ලුතිනන් එස්එම්එන්එන් සුහසිංහ
ලුතිනන් එස්එම්පීඑම්බී සාමසේකර

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

කොළඹ දී ය.

04 - 447

---

2007 අංක 160

අංක : ඩී/ඒඑෆ්ජ්/540.

## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2006 අගෝස්තු මස 04 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත.

එයාර් වයිස් මාර්ෂල් ලාලක හරින්ද්‍රනාත් පීරිස් (01218) – උපකරණ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

04 - 438/1

2007 අංක 161

අංක : ඩී/ඒඑෆ්ජ්/540.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

**අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද නිත්‍ය උප සේවයට මාරු කිරීමක්**

2006 අගෝස්තු මස 04 වන දින සිට පහත නම සඳහන් නිළධාරියා නිත්‍ය ගුවන් හමුදා සේවයේ සිට නිත්‍ය උප සේවයට මාරු කරන ලදී.

එයාර් වයිස් මාර්ෂල් ලාලක හරින්ද්‍රනාත් පීරිස් (01218) –උපකරණ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව නීතිය
හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2006 මැයි මස 31 වැනි දින,
කොළඹ දී ය.

04-438/2

# වෙනත් පත්කිරීම් ආදිය

2007 අංක 162

**ශ්‍රී ලංකා යුද්ධ හමුදා - ස්වේච්ඡා බලසේනාව**

මරණයෙන් පසු යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරන ලද නිළ උසස් කිරීමක්

පහත නම සඳහන් නිළධාරී 2006 ජූලි මස 19 වැනි දින සිට කපිතාන් නිළයට මරණයෙන් පසු උසස් කිරීම යුද්ධ හමුදාධිපති විසින් අනුමත කරනු ලැබ ඇත.

ලුතිනන් පල්ලිය ගුරුගේ සමන් කුමාර ශ්‍රීලංකාආබමු (නි/5898)

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පීඑස්සී, ෆොන්සේකා,
ආර්ඩබ්පී, ආර්එස්පී, ආර්එස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,
ලුතිනන් ජෙනරාල්,
යුද්ධ හමුදාධිපති.

2006 අගෝස්තු මස 15 වැනි දින,

04-440

# ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී 3/32

**ලංකා දුම්රිය සුහසාධක සංගම් ආඥාපනත**

(285 වන අධිකාරය වූ) ලංකා දුම්රිය සුහසාධක සංගම් ආඥාපනතේ 15 වන වගන්තිය යටතේ දුම්රිය සුහසාධක සංගමය විසින් සාදනු ලැබ ඒ වගන්තිය යටතේ මුදල් විෂය භාර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ රීති

ලේකම්,
මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය.

2007 අප්‍රේල් මස 04 වැනි දින,
කොළඹ දී ය.

රීතිය

1908 අංක 16 දරන පාර්ලිමේන්තු පනතින් සම්මතව 1931 අංක 15, 1938 අංක 4 හා 1946 අංක 40 දරන පනත් මගින් සහ 1932 පෙබරවාරි මස 12 වැනි දින අංක 7906 දරන *ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ වරින් වර සංශෝධිත සහ 1999.04.01 දිනැති අංක 1073/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් අවසන් වරට සංශෝධිත, 1997.03.21 දිනැති *ගැසට් පත්‍රයේ* පළ කරන ලද රීති පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ. මෙම රීති 2006.01.01 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

***(1) 7 වන රීතිය–***

7 වන රීතියෙහි (අ)(1) වන ඡේදයට ඉක්බිතිවම එකතු කරන ලද නව (1.අ) ඡේදය පහත පරිදි සංශෝධනය කිරීමෙන්–

(1.අ) 2007 ජනවාරි මස සිට අවම මාසික දායක මුදල රු. 200 ක් වන අතර වසරකට රු. 50 බැගින් අනුක්‍රමිකව වැඩි වී වසර 6 කින් මාසික දායක මුදල රු. 500 ක් වන පරිදි දායක මුදල ගෙවීමට මනාපය පළ කරන සාමාජිකයින්ට මෙහි පහත දැක්වෙන ප්‍රතිලාභ හිමිවිය යුතුය. උපරිම මාසික දායක මුදල රු. 500 කි.

***(2) 9 වන රීතිය–***

9 වන රීතියෙහි 2 වන ඡේදයට ඉක්බිතිවම එකතු කරන ලද ඡේදය පහත පරිදි සංශෝධනය කිරීමෙන්,

9(2)(11) 7(1.අ) රීතියෙහි සඳහන් කර ඇති පරිදි සංස්ථාවට සිය කැමැත්තෙන් දායක මුදල් වැඩි කිරීමට මනාපය පළකර ඇති සෑම

සාමාජිකයකුටම විශ්‍රාම යාමේදී, සේවයෙන් නෙරපනු ලැබීමේදී හා මියයාමේදී ඔහුගෙන් අයකර ඇති පරිත්‍යාග ඇරුයුම් මුදල් පහත දැක්වෙන පරිදි පාරිතෝෂික මුදලට එකතු විය යුතුය.

(අ) 1 වන වර්ෂයේ සිට වර්ෂ 15ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 2.0 ගුණයක්,

(ආ) වර්ෂ 20ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 3.0 ගුණයක්,

(ඇ) වර්ෂ 25ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 3.5 ගුණයක්,

(ඈ) වර්ෂ 28ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 3.8 ගුණයක්,

(ඉ) වර්ෂ 30ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 4.0 ගුණයක්,

(ඊ) වර්ෂ 33ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 4.3 ගුණයක්,

(උ) වර්ෂ 35ක් සම්පූර්ණ කළ විට 10අ. රීතිය යටතේ එම සාමාජිකයා ස්වේච්ඡාවෙන් ගෙවන ලද දායක මුදල්වල එකතුව මෙන් 4.5 ගුණයක්,

*(3) 10 වන රීතිය* :-

10(අ) රු. 120 වෙනුවට රු. 180 ආදේශ කිරීමෙන්

*(4) 24 වන රීතිය* :-

24(3) රු. 1,000 වෙනුවට රු. 3,000 ආදේශ කිරීමෙන් හා රු. 75 වෙනුවට රු. 200 ආදේශ කිරීමෙන්,

*(5) 31 වන රීතිය* :-

31-4 (අ) අයකිරීම් හා තැන්පත් කිරීම් රු. 10 බැගින් රු. 100ක මුදලක් ලැබෙන තුරු වෙනුවට රු. 25 බැගින් රු. 250ක මුදලක් ලැබෙන තුරු, යන්න ආදේශ කිරීමෙන්,

31-4 (ඇ) රු. 10 වෙනුවට රු. 25 යන්න ආදේශ කිරීමෙන්,

31-4 (ඉ) රු. 7,000 වෙනුවට රු. 10,000 ආදේශ කිරීමෙන්,

31-4 (ඊ) මෙම ඡේදයේ අවසන් වැකිය "සාමාජිකයකු මියයාමේදී සංස්ථාවේ ඉතිරි සෑම සාමාජිකයකුගෙන්ම වැඩිපුර රු. 50 ක මුදලක් අයකර ගනු ලැබිය යුතුය" යනුවෙන් සංශෝධනය කිරීමෙන්,

*(6) 32 වන රීතිය* :-

(ඒ) "ප්‍රතිලාභ" යටතේ වූ රු. 5,000 වෙනුවට රු. 25,000 ආදේශ කිරීමෙන්

(බී) "ඉල්ලුම් කිරීම" යටතේ වූ රු. 5,000 වෙනුවට රු. 25,000 ආදේශ කිරීමෙන්

**(7) 33** වන රීතිය :-

(අ) "හිමිකම්" යන ශීර්ෂය යටතේ ඇති සියළු වචන ඉවත් කර පහත දැක්වෙන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්,

"(අ) අවුරුදු 10ට වැඩි අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයකුට මෙම යෝජනා ක්‍රමය යටතේ රු. 25,000ක ණය මුදලක්" සහ

(ආ) අවුරුදු 10ට අඩු අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයකුට මෙම යෝජනා ක්‍රමය යටතේ රු. 10,000ක ණය මුදලක්,

ලබා දිය යුතුය. ණය මුදල වාරික 60කින් ආපසු අය කරනු ලැබිය යුතු අතර පොලිය වර්ෂයකට සියයට දොළහකි (12%). එක් අයකු අවම වශයෙන් අවුරුදු දහයක අඛණ්ඩ සාමාජිකත්වයක් ඇති සාමාජිකයකු ද ඇතුලුව ඇපකරුවන් දෙදෙනකු ඉදිරිපත් කළ යුතු ය. එක් ඇපකරුවකුට ඇපකරු වශයෙන් ක්‍රියා කළ හැක්කේ ණය ලබා ගන්නා දෙදෙනෙකු සඳහා පමණි."

*(8) 34 වන රීතිය* :-

34 වන රීතියෙහි "සාමාජිකත්වය" යන ශීර්ෂය යටතේ ඇති වචන ඉවත් කර පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්–

(අ) මෙම යෝජනා ක්‍රමය ලංකා දුම්රිය සුහසාධක සංගමයේ සියලුම සාමාජිකයන්ට විවෘත වන්නේ ය.

(ආ) ලංකා දුම්රිය සුහසාධක සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යන ගිණුම් අතරින් මෙම ලොතරැයිය දිනුම් අදිනු ලැබිය යුතු අතර, ලොතරැයිය මෙහෙයවීම එම සංගමයේ කමිටුව විසින් කරනු ලැබිය යුතුය. දිනුමක් ලබා ඇති ගිණුමක් හිමි එක් එක් සාමාජිකයාගේ ගිණුම් වලට එක් සාමාජිකයාට රු. 250 බැගින් බැර කරනු ලැබිය යුතුය. මෙම ලොතරැයිය සෑම වර්ෂයකදීම සංගමයේ වාර්ෂික මහ සභා රැස්වීමේදී දිනුම් අදිනු ලැබිය යුතු ය."

එච්. එල්. ආර්. ෆොන්සේකා,
සභාපති.

ඩබ්. කේ. කුසුමාවතී.
ලේකම් හා භාණ්ඩාගාරික.

04-463

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ණය අංක : 21822/135.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.26 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත වූ, පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් ටී. එම්. විමලසේකර විසින් ලියා සහතික කරන ලද අංක 3234 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම උකස්කරු වන කඩවත ඉහළ බියන්විල, ශ්‍රමදාන මාවත, අංක 283/1 හි නිමල්සිරි හේවාදේව යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත

2007.02.19 වන දිනට රුපියල් තුන්ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය හැට හයයි ශත අසූවක (රු. 3,71,366.80) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතු හෙයින්ද, එකී රුපියල් තුන්ලක්ෂ හැත්තෑ එක් දහස් තුන්සිය හැට හයයි ශත අසූවක (රු. 3,71,366.80) ක මුදල සහ 2007.02.19 දින සිට දේපල විකිණීමේ දිනය දක්වා වසරකට සියයට දහතුනයි දශම පහක (13.5%) බැගින් පොලියද, ප්‍රචාරක වියදම් ද දරන ලද වෙනත් ගාස්තු ඇත්නම් එම ගාස්තු හා සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනිමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකර ගත හැකි මුදලද ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල් ද අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 3234 උකස් බැදුම්කරය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කරන දේපල හා පරිශ්‍රය, ප්‍රසිද්ධ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යේජනා සම්මත කරයි.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අධිකාරි පත්තුවේ සියනෑ කෝරලේ, බියගම ප්‍රාදේශීය සභා සීමා තුල ඉහළ බියන්විල පිහිටි ශ්‍රමදාන මාවත, තක්සේරු අංක 44/2/ඒ දරන කොස්ගහවත්ත යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. බී. ජයසේකර විසින් මැන සාදන ලද 2000.03.11 දිනැති අංක 10739 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් දහනවයයි දශම අටක (අංක 0, රූ.0, පර්චස් 19.8)හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි පහයි බිංදුවයි එකක (හෙක්ටයාර් 0.0501) විශාලත්වය ඇති ලොට් “ ඒ ” නමැති ඉඩමට මායිම් ඊශානට : ආර්. ඩී. ඊඩින් අයගේ ඉඩම වන අංක 12280 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 4 ද, ගිණිකොණට : එම්. ගුණවර්ධන අයගේ ඉඩම වන අංක 12280 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 2 ද, නිරිතට : එච්. ඩී. වින්සන් යන අයගේ ඉඩම ද, වයඹට : මාර්ගය වෙන් කරන ඇළද, යන මායිම් ඇතුලත පිහිටි ගොඩනැගිල්ල ඇතුළු එහි පිහිටි සියලු දේ මෙම ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී289/100 යටතේ ලියාපදිංචි වී ඇත.

බලයලත් මිනින්දෝරු පී. එන්. ජේ. පෙරේරා විසින් මැන සාදන ලද 1990.01.12 දිනැති අංක 11207 දරන පිඹුරේ දැක්වෙන ලොට් අංක 5 මතින් හා දිගේ මාර්ග අයිතියද සහිතව.

කළමනාකරු (ණය).

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

04-423

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ණය අංක : 19218/15.

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.26 දින පවත්වන ලද රැස්වීමේදී මෙහි පහත දැක්වෙන යෝජනාව, විශේෂයෙන් සහ ඒකච්ඡන්දයෙන් සම්මත කර ගන්නා ලද බව, 1995 අංක 24 දරන පනතින් සංශෝධිත වූ, පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජාතික ඉතිරිකිරීමේ බැංකුව නමට, ප්‍රසිද්ධ නොතාරිස් ඒ. සී. අමරසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 2130 හා 1999.02.10 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුදල් ගෙවීම උකස්කරුවන බොරලැස්ගමුව, නීලම්මහර, අංක 231/සී පෝරගේ දොන් සිරිපාල යන අය විසින් පැහැර හැර ඇති හෙයින් ද, දැනට එකී උකස් බැඳුම්කරය මත 2007.02.04 වන දිනට රුපියල් දෙලක්ෂ තිස්හයදහස් හත්සිය දහසයයි ශත හැත්තෑ හතරක (රු. 2,36,716.74) මුදලක් ලැබිය යුතුව සහ අයවිය යුතු හෙයින් ද, එකී රුපියල් දෙලක්ෂ තිස්හයදහස් හත්සිය දහසයයි ශත හැත්තෑ හතරක (රු. 2,36,716.74) මුදල හා 2007.02.04 දින සිට දේපල විකිණීමේ දිනය දක්වා වසරකට සියයට පහළොව (15%) බැගින් පොලිය ද, ප්‍රචාරක වියදම් ද දරන ලද වෙනත් ගාස්තු ඇත්නම් එම ගාස්තු හා සංශෝධිත පරිදි වූ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 13 වන වගන්තියට අනුකූලව අයකරගත හැකි මුදලද ඉන්පසුව යම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒ මුදල් ද අඩුකොට අයකර ගැනීම සඳහා ඉහත කී අංක 2130 උකස් බැඳුම්කරය මගින් ජාතික ඉතිරිකිරීමේ බැංකුව වෙත උකස් කර ඇති, මෙහි උපලේඛනයේ සවිස්තරව විස්තර කෙරෙන දේපල හා පරිශ්‍රය, ප්‍රසිද්ධ බලයලත් වෙන්දේසිකාර ෂොක්මන් සහ සමරවික්‍රම මහතුන් ලවා ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත වූ පරිදි 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකරගැනීමේ (විශේෂ විධිවිධාන) පනතින් පැවරී ඇති බලතල යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් යෝජනා සම්මත කරයි.

## උපලේඛනය

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළේ, කැස්බෑව ප්‍රාදේශීය සභා සීමාව තුළ නීලම්මහර පිහිටි මීගහවත්ත යන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එච්. ඒ. ඩී. ප්‍රේමරත්න විසින් මැන සාදන ලද 1997.12.19 දිනැති අංක 2199 දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කට්ටිය වන පර්චස් අටයි දශම හතයි බිංදුවය (අක්. 0, රූ. 0, පර්. 8.70) හෝ හෙක්ටයාර් බිංදුවයි දශම බිංදුවයි දෙකයි දෙකයි බිංදුවක (හෙක්. 0.0220) විශාලත්වය ඇති ලොට් අංක 1 බී නැමති ඉඩමට මායිම් උතුරට : කටුවාවල පාර, නැගෙනහිරට : ඩී. ඩී. එම්. ධර්මපාල අයිතිවාසිකම් කියන ලොට් අංක 2 ද, දකුණට : පී. ඩී. පියසීලි අයිතිවාසිකම් කියන ලොට් අංක 3 ද, බටහිරට : ලොට් අංක 1ඒ ද යන මායිම් ඇතුලත පිහිටි ඉඩම ඇතුළු එහි පිහිටි සියලු දේ මෙම ඉඩම ගල්කිස්ස ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම්. 2344/172 යටතේ ලියාපදිංචි වී ඇත.

කළමනාකරු (ණය).

ජාතික ඉතිරිකිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

04-424

---

## ජාතික ඉතිරිකිරීමේ බැංකුව

ණය අංක : 12485/19/1 පීඩී සහ 14323/19/1පීඩී.

1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 1999.09.24 දින සම්මත කරන ලද යෝජනාව.

මීරිගම, වේවැල්දෙනිය පාරේ "රුචිර" අංක 63 දරන ස්ථානයේ පදිංචි විජයසේකර ආරච්චිගේ දමින්ද විජයසේකර සහ ඩොරීන් නන්දා විජයසේකර විසින්, ප්‍රසිද්ධ නොතාරිස් ක්‍රිශාන්ති පලිහක්කාර මහත්මිය සහතික කළ 93.02.18 දාතමින් යුත් අංක 1042 දරන උකස්කරය සහ 94.12.30 දාතමින් යුත් අංක 1661 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකුව නමට ලියා අත්සන් කරන ලද උකස්කර මත බැංකුවට කළ යුතු ගෙවීම්, එකී විජයසේකර ආරච්චිගේ දමින්ද විජයසේකර සහ ඩොරීන් නන්දා විජයසේකර විසින් පැහැර හැර ඇති බැවින් සහ එකී අංක 1042 සහ 1661 දරන උකස්කර මත රුපියල් හාර ලක්ෂ අනූ දෙදාස් අටසිය අටයි ශත නවයක මුදලක් (රු. 492, 808.09) (99.09.24 දින දක්වා මුල් මුදල සහ පොලිය) දැන් බැංකුවට ණය වී සහ අයවිය යුතුව ඇති බැවින්, 1995 අංක 24 දරන පනත මගින් සංශෝධිත, 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 සහ 5 වන වගන්ති අනුව ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙයින් යෝජනා කර සිටින වග නම්.

බස්නාහිර පළාතේ මීගමුව ලියාපදිංචි කොට්ඨාසයේ, ගම්පහ දිස්ත්‍රික්කයේ හාපිටිගම් කෝරලේ, උඩුගහ පත්තුවේ, මීරිගම උප-කාර්යාල සහ ප්‍රාදේශීය සභා සීමාව තුළ, නෙලිගම පිහිටි වේවැල්දෙනිය පාරේ වරිපනම් අංක 63/1 දරන කහටගහවත්ත නම් වූ ඉඩමට, බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් සාදන ලද, 1992 ජුලි මස 18 වන දිනැති අංක 5473 දරන පිඹුරෙහි, ලොට් අංක බී 1 ලෙස ලකුණු කර ඇති, උතුරු දිගින් : අඩි 12 ක් පළලැති පාරක් සඳහා වෙන්කළ ඉඩමද, නැගෙනහිර දිගින් : ලොට් අංක බී 2 ද, දකුණු දිගින් : ඩී. පී. චන්ද්‍රසේකර සහ වෙනත් අයගේ ඉඩමද, බස්නාහිර දිගින් : එච්. එච්. කේ. ධර්මපාල සහ මිලින්ද විජේසේකරාමගේ ඉඩම් ද මායිම් වී ඇති, එකී අංක 5473 දරන පිඹුර අනුව රූඩ් එකයි පර්චස් තිස් පහක (අ. 0, රූ. 1, ප. 35)ක් විශාලත්වයෙන් යුත්, මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක එෆ්ප් 204/216 යටතේ ලියාපදිංචි කර ඇති, බෙදා වෙන්කළ බිම් කට්ටිය සහ ඒ මත ඇති ගොඩනැගිලි සහ වෙනත් සියළුම දේ සහ අංක 298 දරණ පිඹුරෙහි, පාරක් සඳහා වෙන් කළ (අඩි 8 ක් පළලැති) බිම් කොටස තුළින්, උඩින් සහ ඔස්සේ ප්‍රවේශ වීමේ අයිතිය.

එකී අංක 1042 සහ 1661 දරන උකස්කර මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවට උකස් තබා ඇති ඉහත කී දේපළ, බැංකුව විසින් බලය පවරනු ලැබූ වෙන්දේසිකරුවෙකු විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණා, පූර්වෝක්ත ණය මුදලෙන් ආපසු නොගෙවූ මුළු කොටස හා දේපළ විකුණන දින දක්වා ඒ මත ගෙවිය යුතු පොලිය සමගම, දැන්වීම් පළ කිරීමේ ගාස්තු විකිණීමේ ගාස්තු සහ 1990 අංක 4 දරන බැංකු විසින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) සංශෝධිත පනතේ 13 වන වගන්තිය ප්‍රකාර අයකර ගත හැකි වෙනත් ගාස්තු සහ මුදල් ද අයකර ගත යුතු බවයි.

ණය කළමණාකරු.

ජාතික ඉතිරි කිරීමේ බැංකුව,
අංක 255, ගාලු පාර,
කොළඹ 03.

04-425

---

## මහජන බැංකුව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2004.01.28 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. එල්. ධීරසූරිය මහතා විසින් සහතික කරන ලද 1995.12.14 දින අංක 1572 සහ දන්කොටුව ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ඒ. එෆ්. රන්දෙනිය මහතා විසින් සහතික කරන ලද 1997.04.10 දිනැති අංක 5184 දරන උකස්කරයන් ප්‍රකාර ගෙවීම් අසුරුමුනි සයිමන් ද සිල්වා සහ අසුරුමුනි නිමල් සිරිපාල ද සිල්වා යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරයන් යටතේ රුපියල් එක්ලක්ෂ අනූතුන්දහස් අසූපහක (රු. 1,93,085)ක මුදලක් සහ රුපියල් හාරලක්ෂ පනස් පන් දහසක (රු. 4,55,000)ක මුදලක් මහජන බැංකුවට අයවීමට ඇති බැවින් ද, රුපියල් එක්ලක්ෂ අනූතුන් දහස් අසූපහක (රු. 1,93,085) මුදලට 1998.02.27 දින සිට වසරකට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් ද, රුපියල් හාරලක්ෂ පනස් පන්දහසක (රු. 4,55,000) මුදලට 1999.12.06 දින සිට වර්ෂයට සියයට විසිඑකයි දශම පහ (21.5%) බැගින් ද, වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය, පිරිවැටුම් බදු, ආරක්ෂක බදු හා වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් එක්ලක්ෂ අනූතුන්දහස් අසූපහක (රු. 1,93,085)ක මුදල සහ රුපියල් හාරලක්ෂ පනස් පන් දහසක (රු. 4,55,000)ක මුදල අයකර ගැනීම සඳහා මීගමුව බලයලත් වෙන්දේසිකාර ඩබ්. පී. සී. පෙරේරා මහතා විසින් එකී අංක 1572 හා 5184 දරන උකස්කරයන් යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

#### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කොටසට අයත් කල්පිටිය පත්තුවේ, කල්පිටිය කෝරළේ, වෙල්ලන්කරෙයි නමැති ගමේ පිහිටි "ආරුමුගම් තෝට්ටම්" නමැති අක්කර හතක් (අ. 7, රූ. 0, පර්. 0) විශාල ඉඩම නැවත මැන සාදන ලද පරිදි මෙසේ දැක්වේ.

ඉහත කී වෙල්ලන්කරෙයි නමැති ගමේ පිහිටි "ආරුමුගම් තෝට්ටම්" යනුවෙන් ව්‍යවහාරික ඉඩමට එස්. සංකරලිංගම් බලයලත් මිනින්දෝරුතැන විසින් 1993.09.19 දින මැන සාදන ලද අංක 1194 දරන පිඹුර පරිදි බෙදා වෙන් කරන ලද කැබලි අංක 01 දරන කොටසට මායිම්, උතුරට : පී. එස්. නාගූර් පිච්චෙයි යන අයට අයිති ඉඩම ද, නැගෙනහිරට : ඩබ්ලිව්. නාගූර් පිච්චෙයි යන අයට අයිති ඉඩම ද, දකුණට : රෝහිණී හේමලතා යන අයට අයිති ඉඩම ද, බස්නාහිරට : සන්දිතිඩල් යන අයට අයිති ඉඩම ද රෂීඩ්ට අයිති ඉඩම ද, සංගරපිල්ලෙයිට අයිති ඉඩම සහ පටු පාර ද, යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් අක්කර හතක් (අ. 7, රූ. 0, පර්. 0) විශාල ඉඩමේ බිම සහ ඊට අයත් සැම සියළු දේත් වේ.

මෙය පුත්තලම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ කියු 105/180 යටතේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
හලාවත.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 79, මාරවිල පාර,
නාත්තන්ඩිය.

04-480

## මහජන බැංකුව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2003.01.03 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. ඩබ්. හපුවත්ත මහතා විසින් සහතික කරන ලද 1998.12.08 දින අංක 12858 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් අන්දිරිස් අප්පුහාමිගේ බ්‍රම්පි සිංඤෝ සහ මොරවක විදානලාගේ චන්ද්‍රාවතී පොඩිමැණිකේ යන අය විසින් ගෙවීම් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ රුපියල් හාරලක්ෂයක (රු. 4,00,000)ක මුදලක් දැනට මහජන බැංකුවට ගෙවීමට ඇති බැවින් ද, 2002.06.28 දින සිට වසරකට සියයට විසිහත (27%) බැගින් රුපියල් හාර ලක්ෂයක් (රු. 4,00,000) සඳහා වෙන්දේසි දිනය තෙක් තව දුරටත් පොලිය සහ වෙන්දේසි ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුකර එකී රුපියල් හාර ලක්ෂයක (රු. 4,00,000) මුදල අයකර ගැනීම සඳහා කුරුණෑගල බලයලත් වෙන්දේසිකාර ඩබ්. එම්. අයි. ගල්ලැල්ල මහතා විසින් එකී අංක 12858 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස් කර ඇති දේපළ සහ පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, හිරියාල හත්පත්තුවේ, දිවගන්දහය කෝරළේ, එගොඩගම නමැති ගමෙහි පිහිටා ඇති "කටුවැවේ කරුවල ගහමුල හේන" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. සී. එස්. එම්. අබේසේකර මහතාගේ 1995.09.04 දිනැති අංක 366/ජී දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 2 ඒ දරන ඉඩමට මායිම්, උතුරට : එකී පිඹුරේ අංක 2 බී දරන කැබැල්ල ද, නැගෙනහිරට : ඉබ්බාගමුව සිට මොරගොල්ලාගම දක්වා යන මහා මාර්ගය ද, දකුණට : එකී පිඹුරේ අංක 01 දරන කැබැල්ල ද, බස්නාහිරට : එකී පිඹුරේ අංක 7 දරන කැබැල්ල ද යන මෙකී මායිම් තුළ වූ රූඩ් දෙකක් (අ. 0, රූ. 2, පර්. 0) විශාල ඉඩම සහ ඒ තුළ වූ ගසකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සැම සියලු දේද සමඟ වේ. (බී 519/263-කුරුණෑගල).

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු.

මහජන බැංකුව,
ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලය,
අංක 03, වත්හිමි පාර,
කුරුණෑගල.

04-482

## මහජන බැංකුව - නිට්ටඹුව ශාඛාව

### වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ වන යෝජනාව

වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 ඩී වගන්තිය යටතේ මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2007.01.26 දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කරන ලද බැව් මෙයින් නිවේදනය කරනු ලැබේ.

ගම්පහ ප්‍රසිද්ධ නොතාරිස් එස්. පී. එල්. විජේසිරිවර්ධන විසින් සහතික කරන ලද 2005.04.25 දිනැති අංක 10043 දරන උකස්කරය ප්‍රකාර ගෙවීම් දිසානායක මුදියන්සේලාගේ පියසේන මනතුංග යන අය විසින් පැහැර හැර ඇති බැවින් ද, එකී උකස්කරය යටතේ දැනට රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් හයසියහැට නමය (රු. 1,76,669) ක මුදලක් මහජන බැංකුවට දැනට අයවීමට ඇති බැවින් ද, 2005.12.01 දින සිට වර්ෂයකට 19.25% බැගින් රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් හයසියහැට නමය (රු. 1,76,669) ක මුදලක් සඳහා වෙන්දේසි දිනය තෙක් තවදුරටත් පොලිය හා අදාළ මහජන බැංකු පනතේ 29 එල් වගන්තිය යටතේ අයකරනු ලැබිය යුතු මුදල් සහ ගාස්තු ද සමඟ අනතුරුව කිසියම් ගෙවීමක් ලැබී ඇත්නම් ඒවා අඩුව එකී රුපියල් එක්ලක්ෂ හැත්තෑහයදහස් හයසියහැට නමය (රු. 1,76,669) ක මුදල අයකර ගැනීම සඳහා කොළඹ බලයලත් වෙන්දේසිකාර ඊ. එස්. රාමනායක විසින් එකී අංක 10043 දරන උකස්කරය යටතේ එකී බැංකුවට උකස්කර ඇති දේපළ හා පරිශ්‍රයන් ප්‍රසිද්ධ වෙන්දේසියකදී විකිණිය යුතු යැයි වර්ෂ 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනත යටතේ තමන් වෙත පැවරී ඇති බලතල අනුව මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය මෙයින් තීරණය කරයි.

### උකස්කර ඇති දේපළ පිළිබඳ විස්තරය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, හාපිටිගම් කෝරළේ, යටිගහ පත්තුවේ, මීරිගම ප්‍රාදේශීය සභාවේ පල්ලේවෙල උප කාර්යාල සීමාවේ බටලිය ගමෙහි පිහිටි ලොට් අංක 4473 කණුහැත්තපිල්ලෑව දෙකෙන් පංගුව නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. ඒ. චන්ද්‍රරත්න විසින් 1994.03.16 වැනි දින මැන සකස් කල අංක 6153 ඒ දරන පිඹුරේ ලොට් අංක 1 දරන කොටසට මායිම්, උතුරට : එම්. ඒ. රංගනෝනාට අයත් ඉඩම ද, නැගෙනහිරට : සංවර්ධන සභා පාර ද, දකුණට : ලොට් 2 ද, බස්නාහිරට : ඇල ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසිහතරයි දශම දෙකයි පහ (අ. 0, රූ. 0, පර්. 24.25) ක් විශාල ඉඩම සහ එහි පිහිටි වැවිලි, ගොඩනැගිලි ආදී සියළු දේත් වේ.

මෙම ඉඩම මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ අංක ඩී 267/107 යටතේ ලියාපදිංචි කර ඇත.

ඉහත කී ඉඩමේ පාරවල් සඳහා වෙන් කර ඇති කොටසේ මාර්ග අයිතියද සමඟ වේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ප්‍රාදේශීය කළමනාකරු,
ගම්පහ.

මහජන බැංකුව,
බටහිර III කලාප කාර්යාලය,
අංක 131, නුවර පාර,
බැලුම්මහර,
මුදුන්ගොඩ.

04-484

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.